# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව
**දිනය** : 2013.02.26
**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

1. ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
2. ගරු උප සභාපති ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා
8. ගරු නාගරික මනත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා
9. ගරු නාගරික මනත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් සභාව අමතමින්, තමන් විසින් පසුගිය සභා වාරයේ දී ඉදිරිපත් කරන ලදුව මහා සභාවේ සම්මත වූ යෝජනාව සභා වාර්තාවට ඇතුලත් වී නැති බව දන්වන ලදී. එම යෝජනාව 2013 පෙබරවාරි මස මහා සභා වාර්තාවට සංශෝධනයක් වශයෙන් ඉදිරිපත් කිරීමට යටත්ව සභා වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මේ පවත්වන්නට යෙදෙන්නේ 2013 වර්ෂයේ පෙබරවාරි මාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් සභාව අමතමින්, මෙම සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඇතුළු සියළු දෙනා ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් 2013.01.29 වන දිනැති මහා සභාවේ න්‍යායපත්‍රයට ඉදිරිපත් කරන ලදුව ගරු සභාපතිතුමන්ගේ යෝජනාව පරිදි එම මන්ත්‍රීතුමන්ගේ ස්ථිරත්වයෙන් මහා සභාවේ සම්මත කරන ලද, මහා සභා වාර්තාවට මුද්‍රණ දෝශයක් හේතුවෙන් ඇතුලත් නොවූ යෝජනාව පහත පරිදි වේ.

**11:03 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

**2013 අයවැය ප්‍රතිපාදන වලින් අඩු ආදායම්ලාභීන් සඳහා සෙවිලි තහඩු ලබා දීම**

ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

**06:01 වරිපනම් ගාස්තු අඩු කර ගැනීම - 20/38**

බී. ඒ. ජුවන් නයිදේ මගින් බී. ඒ. එස්. ජයරත්න හා අනෙකුත් අය නමින් නො. 20/38 පරණ පාර, බලන්ගොඩ, අංකය යටතේ වරිපනම් ගෙවන නිවස අබලන්ව ඇති බැවින් වරිපනම් සහනයක් ලබා දෙන මෙන් ඉල්ලීමක් මහා සභාව වෙත ලැබී ඇති බව දැනුම් දුන් ගරු සභාපතිතුමා එම ගොඩනැගිල්ල සඳහා රු. 200.00කින් බදු මුදල් අඩු කිරීමට යෝජනා කළේය.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් හෝ යෝජනා ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය

**06:02 වරිපනම් සහනයක් ලබා ගැනීම - 275**

රත්නපුර පාර, අංක 275 යන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල දිරාපත්ව ඇති බැවින් වරිපනම් සහනයක් හිමි කරු විසින් ඉල්ලා ඇති බව සඳහන් කරන ලද ගරු සභාපතිතුමන් අදාල ඉඩම සඳහා පමණක් වරිපනම් අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 ඒ 22/01 කඩ කාමරය පවරා දීම**

ඒ 22/01 දරන කඩකාමරය තමන් හට පවත්වාගෙන යාම අපහසු බැවින් එය කදිරවේල් රොෂාන් යන අයට පවරා දීමට කැමැත්ත පළ කර ජී. නන්දසේන යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව දැන්වූ ගරු සභාපතිතුමන් අදාල අයට එම කඩ කාමරය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:04 කාර්යාලයීය දුරකථනයට සී. එල්. අයි. පහසුකම ලබා ගැනීම

නගර සභා කාර්යාලයේ 045-2287275 අංකය දරන දුරකථනය සඳහා සී එල් අයි පහසුකම ලබා ගැනීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් යොජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:05 2012.12.31 වන දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව

2012.12.31 වන දිනට අදාල නගර සභාවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:06 දේශීය ණය හා සංවර්ධන අරමුදල සහ බළන්ගොඩ නගර සභාව අතර බේරුම්කරණ තීන්දුව

නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘති ආධාර යටතේ ඉදිකරන ලද වැසි ජල කාණු පද්ධතියට අදාල ණය මුදල සම්බන්ධයෙන් බළන්ගොඩ නගර සභාව හා දේශීය ණය හා සංවර්ධන අරමුදල අතර පැවති බේරුම්කරණයේ තීන්දුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලද අතර, එමගින් ණය මුදල ගෙවීමට මෙම නගර සභාවට නියමව ඇති බව දැන්වූ ගරු සභාපතිතුමන්, ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06:07 2013 වර්ෂය සඳහා කසළ කළමනාකරණය පිළිබඳ සැලැස්ම ඉදිරිපත් කිරීම

2013 වර්ෂයට අදාල කසළ කළමනාකරණ සැලැස්ම ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:08 සුසාන භූමි නඩත්තුකරුවකු සහ ට්‍රැක්ටර් රියදුරකු බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීම

මෙම සභාවේ ඇල්ලෙපොල සුසාන භූමියේ නඩත්තු කටයුතු සඳහා පත් කර තිබූ උපාලි දයානන්ද මහතා මිය ගිය බැවින් ඒ සඳහා සේවා ගිවිසුමක් මත නව සුසාන භූමි නඩත්තුකරුවකු පත් කිරීමට ද, දැනට ට්‍රැක්ටර් රියදුරකු වශයෙන් කටයුතු කරන බී. ජී. ජයසිංහ මහතා වයස අවුරුදු 60 සම්පූර්ණ වීම හේතුවෙන් 2013.02.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම යාමට නියමිත බැවින් සේවා ගිවිසුමක් මත ට්‍රැක්ටර් රියදුරකු බඳවා ගැනීමට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 සබරගමුව පළාත් මහජන සෞඛ්‍ය පරීක්ෂක ස්ථාන මාරු**

සබරගමුව පළාත් මහජන සෞඛ්‍ය පරීක්ෂක ස්ථාන මාරු වීම් යටතේ මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වශයෙන් කටයුතු කරනු ලබන එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා අනුප්‍රාප්තිකයකු රහිතව නිවිතිගල/කරවිට ක්ෂේත්‍රය සඳහා මාරු කරන බව දන්වා මෙම සභාවේ ලේකම්ට ද පිටපතක් සහිතව සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (රත්නපුර/කෑගල්ල) සහ සබරගමුව පළාත් පාලන කොමසාරිස් වෙත එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එමෙන්ම මෙම සභාව ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කීර්තිමත් පළාත් පාලන ආයතනයක් බවට පත් කිරීමට ඉවහල් වූ සාර්ථක කසළ කළමනාකරණ වැඩසටහන සහ දැනට ආරම්භ කර ඇති ආපදා පෙර සූදානම් වීමේ වැඩසටහන ඇතුළු ව්‍යාපෘතීන් රැසක් මෙම ස්ථාන මාරුව හේතුවෙන් ඇණහිටීම සිදුවන බැවින් එම ස්ථාන මාරුව අවලංගු කරන මෙන් දන්වා යැවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාම මෙම ස්ථාන මාරුව අවලංගු කිරීම සඳහා ඉල්ලා සිටීම සුදුසු බවට අදහස් දැක්වූ අතර, එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බස් නැවතුම්පොල වැසිකිළි කඩා සාදන ලද කාමරයක් කුලී පදනම මත ලබා ගැනීම**

නව බස් නැවතුම්පොලෙහි වැසිකිළි කඩා සාදන ලද කාමරයක් ලබා දෙන මෙන් බී. ගුණරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමා, එම කඩ කාමරයක් මින් පෙර අදාල කඩ කාමර ලබා දුන් පරිදි මාසික කුලී පදනම මත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 දොරවෙල ඔය ඉවුරු සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය - 1 අදියර**

දොරවෙල ඔය ඉවුරු සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියට අදාල වැට් මුදල වන රු. 1,681,560.00ක මුදල සභාවෙන් ගෙවන මෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා ඇති බව සඳහන් කළ සභාපතිතුමන්, එම ගෙවීම සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් සභාවෙන් එම ගෙවීම සිදු කිරීමට ඒකමතිකව සම්මත කරන ලදී.

**06:12 වරිපනම් නිදහස් කර ගැනීම - 321/1**

මිරිස්වත්ත, බලන්ගොඩ පිහිටි වරිපනම් අංක 321/1 දරන ගොඩනැගිල්ල වසා දමා ඇති බැවන් එම ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු නිදහස් කර දෙන මෙන් මංජුල කිත්සිරි ගවරම්මාන යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලද අතර අදාල ගොඩනැගිල්ල සඳහා 50%ක ප්‍රමාණයකින් බදු නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව එහි අනුමත වී ඇත.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

සභා අනුමැතිය සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් නොවීය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

### 09:01 දොරවෙල ඔය ඉවුරු සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය I අදියර - ගැටළු සාකච්ඡා කිරීම සහ ප්‍රසම්පාදන කමිටු වාර්තාව

දොරවෙල ඔය ඉවුරු සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ෂ අදියර - ගැටළු සාකච්ඡා කිරීම සහ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

### 09:01 පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය සඳහා ලංසු පත් විවෘත කිරීම කැඳවීම - 2012.02.21

පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය සඳහා ලංසු පත් විවෘත කිරීම කැඳවීමේ 2012.02.21 දිනැති මිල කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඒ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර අදාල කඩ කාමරය සඳහා ලංසු කිසිවක් ඉදිරිපත් වී නැති බැවින් මිල 10%කින් අඩු කර නැවත පුවත්පත් දැන්වීම් පළ කිරීමකින් තොරව ටෙන්ඩර් කිරීමට ප්‍රසම්පාදන කමිටුව ගත් තීරණයට අනුව කටයුතු කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

### 11:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා

**1. බලන්ගොඩ ඉරිදා පොල, නගර සභාව මගින් පාලනය කිරීම සම්බන්ධව සාකච්ඡාවට ලක් කිරීම**

මේ සම්බන්ධව සභාවේ ආදායම් පරීක්ෂක මහතා ද සහභාගී වන කාරක සභා අවස්ථාවක දී සාකච්ඡාවට ගැනීම සුදුසු හෙයින් 2013 මාර්තු මස මහා සභා රැස්වීමේ දී සංවාදයට ලක් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**2. ආහාර සකස් කරන හා බෙදා හරින ස්ථාන වල සනීපාරක්ෂාව**

1980 අංක 26 දරන ආහාර පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් අංක 1742/26 හා 2012.01.26 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආහාර සකස් කරන, බෙදා හරින හා විකුණනු ලබන ස්ථාන වල සනීපාරක්ෂක තත්ත්වයන් නැංවීම පිණිස නීති ගණනාවක් සකස් කර ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීමට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යොමු කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය. මේ සම්බන්ධව ආහාර සකස් කිරීම හා බෙදා හැරීමට සම්බන්ධ හෝටල්, ආපන ශාලා හා නවාතැන් පොළ හිමියන් දැනුවත් කිරීමේ රැස්වීමක් 2013.02.06 වන දින බලන්ගොඩ තානායමේ දී පැවැත්වීමට තීරණය විය.

**11:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

1. ෆලීල් හජ්ජියාර් මාවත, බෙතල්හිල් මාවත, සුබහිර් ආලීම් මාවත හා මුස්තෆා මාවත ප්‍රතිසංස්කරණය කිරීම
2. 'සභාපති කුසලාන' නමින් පාපන්දු තරගාවලියක් පැවැත්වීම
3. මන්ත්‍රී ප්‍රතිපාදන වලින් දෙහිගස්තලාව ප්‍රධාන මුස්ලිම් දේවස්ථානයට ටකරං මඩුවක් හා ප්ලාස්ටික් පුටු ලබා දීම

ඉහත යෝජනාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර, එම යොජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ඉහත 1 හා 3 යෝජනාවන් ක්‍රියාත්මක කිරීමට මහා සභාවේ ඒකමතිකව සම්මත වූ අතර, පාපන්දු තරගාවලිය පැවැත්වීම සම්බන්ධව ඉදිරියේ දී සොයා බලා කටයුතු කිරීමට තීරණය විය.

**11:03 ගරු නාගරික මන්ත්‍රී ඒ. ඒ. එන්. විජයසිංහ මැතිතුමා**

1. නගර සභාවට ගෙන්වා ගත් වතුර මෝටරය නැවත දොරවෙල ගම් වාසීන්ට ලබා දීම

2012.01.29 වන දින මහා සභාවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කර තිබූ මෙම යෝජනාව, ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමන් එදින රැස්වීම් වාරයට නොපැමිණිම හේතුවෙන් මෙම සභා වාරයේ දී සාකච්ඡාවට ගැනීමට තීරණය වූ බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඒ. ඒ. එන්. විජයසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව සභාවේ සංවාදයට ලක් වූ අතර, අදාල ජල ටැංකිය ඉදිකිරීමට අමතරව බුදු මැදුරක් ද ඉදි කිරීම හේතුවෙන් මෙම ගැටළුව ඇති වී තිබෙන බවත්, මෙම අමතර ඉදිකිරීම් සම්බන්ධව සභාවට වගකීමක් දැරීම කළ නොහැකි බැවින් මෙයට අදාල මහා සංඝරත්නය සහ දොරවෙල ප්‍රදේශයේ ජනතාව සමග සාකච්ඡා කර තීරණයක් ගැනීමට 2012.03.06 වන දින ප. ව. 06.00ට දොරවෙල තුරු උයනේ දී රැස්වීමක් පැවැත්වීමට තීරණය විය.

**11:04 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

1. මාගා ජල යෝජනා ක්‍රමයේ නගර සභා බල ප්‍රදේශයට අයත් සංවර්ධන කටයුතු නගර සභාවෙන් අධීක්ෂණය කිරීම.
2. නව අතුරු මාර්ගයේ සිට බස් නැවතුම්පොලට පිවිසෙන මාර්ගයේ රථවාහන ඇතුල් කිරීම නැවැත්වීම
3. නගරයේ රථවාහන නැවැත්වීමේ ස්ථාන වල අක්‍රමවත් බව පිළිබඳ සාකච්ඡා කිරීම

මේ සම්බන්ධව අදාල අංශයන් සමග සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා 2013.03.06 වන දින ප.ව. 04.00ට බලන්ගොඩ තානායමේ දී රැස්වීමක් පැවැත්වීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2013 ජනවාරි මාසය සඳහා අදාල ලැබීම් හා ගෙවීම්විග්‍රහය

- 2013 ජනවාරි මාසය සඳහා වන ලැබීම් හා ගෙවීම් විග්‍රහය සහ

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 12,213,098.46 |
| වෙනත් ලැබීම් | 953,816.41 |
| **මුළු ලැබීම්** | **13,166,914.87** |
| පුනරාවර්තන වියදම් | 4,700,701.75 |
| වෙනත් වියදම් | 742,511.49 |
| මුළු වියදම් | **5,443,213.24** |

- බළන්ගොඩ තානායමේ 2013.01.01 සිට 2013.01.31 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.
  එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 2013.01.01 සිට 2013:01.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව

2013.01.01 සිට 2013:01.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 313,307.75කි

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 13:01 මුදල්, ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව

2013.02.18 වන දිනැති මුදල්, ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 14:01 තානායම් කමිටු වාර්තාව

2013.02.18 වන දිනැති තානායම් කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 16. වෙනත් කරුණුඃ

### 16:01 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමාඃ

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා සභාව අමතමින්, ඇල්ලෙපොල සුසාන භූමිය සම්බන්ධව කටයුතු කරන ලද මහතාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කරන බව සඳහන් කළ අතර, මේ හේතුවෙන් අසරණ බවට පත් වූ එම මහතාගේ

දරුවන් හට අධ්‍යාපනය සඳහා තමන්ගේ මන්ත්‍රී දීමනාව මන්ත්‍රී ධූරයේ රැඳී සිටින තෙක් ලබා දීමට කටයුතු කරන බව ද දැනුම් දෙන ලදී.

**16:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා සභාව අමතමින්, ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමන් විසින් තම මන්ත්‍රී දීමනාව ඇල්ලෙපොල සුසාන භූමිය සම්බන්ධ කටයුතු කරන ලද මහතාගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබා දීම සම්බන්ධයෙන් තම ප්‍රශංසාව පළකරන බව ප්‍රකාශ කළේය.

බලන්ගොඩ නගර සභාව කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රසාදයට ලක් වන තත්ත්වයට පත් කිරීම සඳහා මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. නිමල් ප්‍රේමතිලක මහතා ඉමහත් සේවාවක් සිදු කරන ලද බව දැක්වූ අතර, එම මහතා ස්ථාන මාරු වීම හේතුවෙන් එම කටයුතු අඩාල වනු ඇති බව දැනුම් දෙන ලදී. එබැවින් එම මහතාගේ ස්ථාන මාරුව අවලංගු කිරීමට සියළු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනාවෙන් සම්මත විය යුතු බවට ප්‍රකාශ කළේය. එමෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා ස්ථාන මාරු කිරීම අවශ්‍යම නම් අදාල කාර්යයන් සම්බන්ධව වෙනත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතකු පුහුණු කළ යුතු බව ද සඳහන් කළේය.

එමෙන්ම තම වසමේ අළුත්වැඩියා කළ යුතු මාර්ගයන් පවතින බව ද, කුමාරගම පාර ඉතිරි කොටස සහ පංසල දක්වා මාර්ගය ඒ සම්බන්ධයෙන් වඩාත් වැදගත් වන බව ද, සඳහන් කළ එතුමා ඒ පිළිබඳව කර්මාන්ත කමිටුවේ ගරු සභාපති ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මහතාගේ අවධානය යොමු කර අළුත්වැඩියා කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටියේය. ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් පාපන්දු තරගාවලියක් පැවැත්වීමට සිදු කරන ලද ඉල්ලීම සම්බන්ධව ප්‍රසාදය පළ කළේය. වසර කිහිපයකට පෙර බලන්ගොඩ ප්‍රදේශයේ ක්‍රීඩාව අතින් ඉදිරියෙන් තිබූ බව ද සඳහන් කළේය. පාසැල් මට්ටමෙන් මෙම ක්‍රීඩා කටයුතු ආරම්භ කිරීම සුදුසු බව සඳහන් කළේය. ගරු උප සභාපතිතුමන් ඇතුලු මන්ත්‍රීතුමන්ලා ද පාපන්දු ක්‍රීඩාව සම්බන්ධයෙන් දැඩි උනන්දුවකින් කටයුතු කරන බව ද සඳහන් කළ එම්. ටී. එම්. රූමි මැතිතුමා, මේ සම්බන්ධව වැඩිදුරටත් සංවාදයට ලක් කර වියදම් ඇස්තමේන්තු පිළිබඳව ද සලකා බලා තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කළේය.

**16:03 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් සභාව අමතමින්, බලන්ගොඩ මහජන පුස්තකාලයට දෙමළ මාධ්‍ය පුවත්පත් නිසි වේලාවට නොලැබෙන බව ද, පෙරවරු 08.00ට පෙර පුස්තකාලය වෙත ලබා දීමට කන්දසාමි ස්ටෝර්ස් ආයතනය වෙත දැන්වීම සුදුසු බව ද සඳහන් කළේය. එමෙන්ම මහජන පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා නගර සීමාවේ දරුවන්ට අමතරව නගර සීමාවෙන් පිට අයට ද අවස්ථාව ලබා දීම සුදුසු බව ද, නගරයේ රාජ්‍ය ආයතනයන වල සේවය කරන නිලධාරී මහත්ම මහත්මීන් සඳහා ද අදාල ආයතන ප්‍රධානියාගේ නිර්දේශය මත එම අවස්ථාව ලබා දීම සුදුසු බව වැඩි දුරටත් සඳහන් කළේය.

මස් හා මාළු කඩ සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික තරාදියක් ලබා දීමට ඉල්ලීමක් සිදු කරන ලද බව දැක්වූ එතුමන් මෙතෙක් අදාල කාර්යය ඉටු වී නැති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටියේය.

එළැඹෙන සිංහල හා හින්දු අලුත් අවුරුදු සමයේ විශාල ජනකායක් බලන්ගොඩ නගරයට පැමිණීමට නියමිත බැවින් නිසි රථවාහන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු බවට ද, පදික වෙළඳුන් සඳහා එම කාල සීමාවට පමණක් වෙළඳ කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා දීම කළ යුතු බවට ද සඳහන් කළේය.

පළාත් පාලන මායිම් සකස් කිරීමේ දී ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සමඟද සාකච්ඡා කර අදාල මායිම් නිර්ණය කිරීම සුදුසු බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

*මේ සම්බන්ධව අදහස් දක්වමින් **ගරු සභාපතිතුමන්** ප්‍රකාශ කරන ලද්දේ මේ වන විටත් එම සීමා මායිම් නිර්ණය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව ද, ඒවා ග්‍රාම නිලධාරීන් හරහා සිදුවන බව ද සඳහන් කළේය.*

**16:04 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු උප සභාපතිතුමන් මහා සභාව අමතමින්, සභා කටයුතු සම්බන්ධ ප්‍රගතිය ඉදිරිපත් කිරීමේ දී වඩාත් වැදගත් වන්නේ මාර්ග නඩත්තු කිරීම් ඇතුළු කර්මාන්තයන්හි ප්‍රගතිය ඉදිරිපත් කිරීම බව  සඳහන් කළේය. ඕනෑම පුද්ගලයකු තමන්ගේම වාහනය හොඳින් තබා ගැනීමට කැමැත්තක් දක්වන බැවින්, මාර්ග පද්ධතිය නිසි ආකාරව පවත්වා ගැනීම සඳහා සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතු බවට වැඩි දුරටත් සඳහන් කළේය. මෙතෙක් කාලයක් ඉතා හොඳින් සභාව විසින් එම කාර්යය ඉටු කළ බැවින් ඉදිරියට ද, කම්කරුවන් කුළී පදනම මත හෝ යොදවා අදාල සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කිරීම කළ යුතු බව සඳහන් කළේය.

බුලත්ගම දෙමළ මධ්‍ය මහා විද්‍යාලයට යන මාවත අසල ඇති අජිත් මහතාගේ නිවස අසළ ඇති කොස් ගස, අඹ ගස සහ පොල් ගස හේතුවෙන් පාසැල් දරුවන් හට අනතුරුදායක තත්ත්වයක් ඇති බව ද, ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීම සඳහා සභාවට දන්වන බව ද සඳහන් කළේය. එමෙන්ම වේවැල්වත්ත ප්‍රදේශයේ සිට පැමිණෙන එම විදුහලේ දරුවන් හට යාමට ඇති බස් රථය පාසැල අසලින් නොනවත්වා ධාවනය කිරීමෙන් ඔවුන් මහත් අපහසුතාවයට ලක් වන බව සඳහන් කළ ගරු උප සභාපතිතුමන්, මේ පිළිබඳව අදාල අංශයන් දැනුවත් කර ඔවුන්ට සාධාරණයක් ඉටු කළ යුතු බව සඳහන් කළේය.

ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව ඉදිවන රණවිරු නිවාසයට යාමට ඇති මාර්ගය ද අබලන් තත්වයේ ඇති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කර පිළිසකර කටයුතු සිදු කළ යුතු බව ද, මාගා ආයතනය මගින් වැලිහරණාව ඉහල දෙසට යන මාර්ගයට අදාල ඉදිකිරීම් කටයුතු සඳහා ද අවධානය යොමු කළ යුතු බව ද සඳහන් කළේය.

මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. නිමල් ප්‍රේමතිලක මහතා ස්ථාන මාරු වීම සම්බන්ධව පෞද්ගලිකව අකැමති වුවත් ඔහු විසින් සිදු කරන ලද සේවාව තව දුරටත් සිදු කිරීම සඳහා තවත් ඉහල තැනකට ස්ථාන මාරු වීම වීම සිදුවන්නේ නම් ඒ සඳහා ඉඩ දීම කළ යුතු බව ද, අදාල නිලධාරියා නොමැති වුවත් එම කාර්යයන් ඉදිරියට පවත්වා ගැනීමට නිලධාරීන්ට හැකි විය යුතු බව දක්වන ලදී.

නගර සභාවේ අනුග්‍රහයන් ක්‍රීඩා තරගාවලි පැවැත්වීමේ දී පාසැල් මට්ටමට අවධානය යොමු නොකර විවෘත මට්ටමෙන් සිදු කිරීම ඉතා සුදුසු බව ද එතුමා ප්‍රකාශ කළේය. බළන්ගොඩ නගරයේ මේ වන විට පාපන්දු ක්‍රීඩා කරන කණ්ඩායම් ඉතා සීමිත බව ද වැඩි දුරටත් දක්වන ලදී.

**16:05 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභාව අමතමින්, පුස්තකාලයේ පොත් බැහැර ගෙන යාම සම්බන්ධයෙන් පුස්තකාලයාධිපතිනියට වගකීමක් ඇති බැවින් නගර සීමාවෙන් පිටත සාමාජිකයන්ට එම අවස්ථාව ලබා දීම අවදානමක් බව ද, රජයේ සේවකයන් සඳහා එම අවස්ථාව ලබා දීමේ දී එය ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිර්දේශය මත සිදු කළ යුතු බව සඳහන් කළේය.

පහසුකම් සපිරි ක්‍රීඩාංගනයක් සාදන තුරු නගර සභා ක්‍රීඩා පිටියේ ඇති වලවල් වසා ප්‍රතිසංස්කරණය කිරීම කළ යුතු බව ද, මේ වලවල් හේතුවෙන් ක්‍රීඩාකටයුතු සිදුකරන්නන් හට ආබාධයන්ට ලක් වීමට සිදුවන බව ද සඳහන් කළේය. සබරගමුව පළාත් ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලිකත්වයෙන් ජාතික මට්ටමේ වොලිබෝල් තරගාවලියක් පැවැත්වීම නිසා ක්‍රීඩා පිටියේ ප්‍රේක්ෂකාගාරය ද වසර ගණනාවකට පසු නවීකරණය කළ හැකි වීම වැදගත් කරුණක් බව සඳහන් කළේය.

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා ස්ථාන මාරු වීමට පෞද්ගලිකව තමන් ද අකැමති වුවත්, ඒ මහතාගේ සේවාව ආයතන වල ද ක්‍රියාත්මක කිරීමට සිටින තැනින් ඉහල මට්ටමකට යාමට හැකි නම් ඒ සඳහා ආශිර්වාදය හිමි වන බව ද සඳහන් කළේය.

**16:06 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාව අමතමින්, මාර්ග පද්ධතිය අබලන් වීමට ප්‍රධාන හේතුව දැඩි වර්ෂාපතනයට නිරාවරණය වීම බව සඳහන් කළේය. එමෙන්ම දැනට ඇති මාර්ග සංවර්ධන කටයුතු කිරීම සඳහා නගර සභාවට අනුයුක්ත කම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවන බව සඳහන් කළේය. එකවර මාර්ග දෙකක් හෝ සෑදීමට අවශ්‍ය කටයුතු කරන්නේ නම් මාර්ග නඩත්තුව සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කළ හැකි බව සඳහන් කළේය.

මාගා ආයතනය මගින් ජලනල එළීමේ දී වැඩ අධිකාරී/කාර්මික නිලධාරී අධීක්ෂණය යටතේ සිදු කිරීමෙන් නිසි ප්‍රමිතියකට එම කටයුතු සිදු කළ යුතු බව සඳහන් කළේය.

*මේ සම්බන්ධව අදහස් දක්වමින්* ***ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන්*** *අදහස් දක්වා සිටියේ ජල, විදුලි සම්බන්ධතාවයන් සඳහා මාර්ගයන්හි පොදු නලයක් ස්ථාපිත කිරීමට හැකි නම් නැවත නැවත එම ජල හා විදුලි සබඳතාවයන් අලුත්වැඩියා කිරීමේ දී මාර්ගයන්ට සිදුවන වියදම අඩු කර ගැනීමට හැකි බව සඳහන් කළේය.*

## 17. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

මෙම සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය දැක්වූ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරීන්ට ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමන් විසින් 2013 මාර්තු මාසයට අදාල මහා සභා රැස්වීම ප.ව. 1.00ට පමණ අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.